(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 11.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2020 පෙබරවාරි 07 වැනි සිකුරාදා පූ.භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ සබඳතා අමාත්‍යතුමා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී සම්පත් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** ජාත්‍යන්තර සහයෝගීතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** වරාය සංවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **ජෝන් අමරතුංග මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **වසන්ත අලුවිහාරේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **පියසේන ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **මලිත් ජයතිලක මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **අනුරාධ ජයරත්න මහතා**

ගරු **ලකී ජයවර්ධන මහතා**

ගරු **මයිල්වාගනම් තිලකරාජා මහතා**

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**

ගරු **අනුර දිසානායක මහතා**

ගරු **මයන්ත දිසානායක මහතා**

ගරු **වීරකුමාර දිසානායක මහතා**

ගරු **ඩිලාන් පෙරේරා මහතා**

ගරු **අජිත් පී. පෙරේරා මහතා**

ගරු **අශෝක ප්‍රියන්ත මහතා**

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**

ගරු **සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා**

ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු සමන් රත්නප්‍රිය මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු මංගල සමරවීර මහතා
ගරු සන්දිත් සමරසිංහ මහතා
ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
ගරු මුත්තු සිවලිංගම් මහතා
ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු චතුර සංදීප සේනාරත්න මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා
ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්
නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්
කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්
ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයාගේ නිවේදන :** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ශ්‍රී ලංකා පරිසර වෘත්තියවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ 113(2) ස්ථාවර නියෝගය ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් කථානායකවරයා විසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි:—

ගරු තාරක බාලසූරිය මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු කරුණාරත්න පරණවිතාන මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය"

**II**

" 'ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ 113(2) ස්ථාවර නියෝගය ප්‍රකාරව, ව්‍යාවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් කථානායකවරයා විසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි:—

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

පිළිගන්වා, එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්, 2013/2014 සහ 2014/2015 වර්ෂ සඳහා මාන්තයි සෝල්ට් ලිමිටඩ් හි වාර්ෂික වාර්තා සහ ගිණුම් පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2018 වර්ෂය සඳහා වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2016 සහ 2017 වර්ෂ සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iv) 2018 වර්ෂය සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(v) 2015 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(vi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(vii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(x) 2014, 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා; සහ

(xi) 2016 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී විජිත හේරත් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2018 වර්ෂය සඳහා අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2018 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව;

(vi) 2018 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2016 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව;

(x) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(xi) 2016 වර්ෂය සඳහා සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව;

(xii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය;

(xiii) 2016 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xiv) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා; සහ

(xv) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු සමරසිංහ මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින්, එම කාරක සභාව විසින් සකස් කරන ලද "ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය ස්ථාපනය කිරීම" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) :** අග්‍රාමාත්‍යවරයා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යවරයා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2020 පෙබරවාරි 18 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.30 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

**6. ශෝක ප්‍රකාශ යෝජනා :** අග්‍රාමාත්‍යවරයා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යවරයා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින්, අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු සී. නන්ද මැතිව් මහතා, ගරු (වෛද්‍යාචාර්ය) රංජිත් අතපත්තු මහතා, ගරු ප්‍රින්ස් කාසිනාදර් මහතා සහ ගරු එම්. එස්. තේමිස් මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන ලදී.

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු සී. නන්ද මැතිව් මහතා, ගරු (වෛද්‍යාචාර්ය) රංජිත් අතපත්තු මහතා, ගරු ප්‍රින්ස් කාසිනාදර් මහතා සහ ගරු එම්. එස්. තේමිස් මහතාගේ අභාවයන් පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් කථානායකවරයා සමඟ ඊට එකතු වූ නියෝජ්‍ය කථානායකවරයා මෙම යෝජනාවට සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපත ශෝකයට පත් පවුල්වල අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරන ලදී.

**7. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභා නායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 3.11 ට, 2020 පෙබරවාරි 18 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.